සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ 2019 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් ඇතුළත්කර ගැනීම සඳහා පවත්වනු ලබන තරග විභාගය - 2018 සැප්තැම්බර්


**(01)** භාෂා හැකියාව

පැ තුනයි

## විභාග අපේක්ෂකයන්ට උපදෙස්

ඉතා වැදගත් :

පිළිතුරු ලිවීම සඳහා පැන්සල භාවිත නොකරන්න.



✳ පිළිතුරු සැපයීමේ දී පහත සඳහන් ආකාරයට පැහැදිලිව ඉලක්කම් ලියා නැති උත්තර පත්‍ර ඇගයීමට ලක් නොකෙරේ.

**1 2 3 4**

ඔබේ විභාග අංකය මෙහි ද තුන්වන හා පස්වන පිටුවල ඇති තිත් ඉරි මත ද ලියන්න.

.................................

නිවැරදි බවට නිරීක්ෂකගේ කෙටි අත්සන

.................................

වැදගත් :

✳ මෙම ප්‍රශ්න පත්‍රය පිටු **10** කින් හා ප්‍රශ්න **38** කින් යුක්ත වේ.

✳ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.

✳ ශාලාධිපතිවරයා නිවේදනය කළ පසු පිළිතුරු ලිවීම ආරම්භ කරන්න.

✳ දී ඇති උපදෙස් අනුව ම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු වන අතර උපදෙස්වලට පටහැනිව සපයන පිළිතුරු සඳහා ලකුණු දෙනු නොලැබේ.

✳ ඔබට සැපයීමට පිළිතුරු නැතත් මෙම පිළිතුරු පත ශාලාධිපතිට භාර දිය යුතු ය.

✳ ඔබේ පිළිතුරු පැහැදිලි ලෙස නිල් හෝ කළු පැනෙන් පමණක් ලියන්න. පැන්සල් පාවිච්චි නොකරන්න.

✳ මෙම ප්‍රශ්න පත්‍රය විභාග ශාලාවෙන් පිටතට ගෙන යාම හෝ එහි ඡායා පිටපත් ගැනීම හෝ වරදකි.

✳ අපැහැදිලි ඉලක්කම්, අපැහැදිලි අත් අකුරු සහිත, මකන දියර භාවිත කරන ලද සහ පැන්සලෙන් පිළිතුරු සපයන ලද පිළිතුරු පත්‍ර ඇගයීමට ලක් නොකෙරේ.

පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි

| පිටුව | ප්‍රශ්න අංකය | ලකුණු |
|---|---|---|
| 2 | 1 – 12 | |
| 3 | 13 – 25 | |
| 4 | 26 – 35 | |
| 5 - 6 | 36 | |
| 7 - 8 | 37 | |
| 8 - 10 | 38 | |
| එකතුව | | |

අවසාන ලකුණු

| | |
|---|---|
| ඉලක්කමෙන් | |
| අකුරින් | |

| | |
|---|---|
| උත්තර පත්‍ර පරීක්ෂක | |
| ලකුණු පරීක්ෂා කළේ | |

[ 2 වැනි පිටුව බලන්න.

● අංක **1** සිට **3** තෙක් එක් එක් ප්‍රශ්නය යටතේ දී ඇති පද අතුරින් එක් පදයක පමණක් අක්ෂර වින්‍යාසය වැරදිය. එම පදය තෝරා, එහි අංකය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති **තිත් ඉර** මත ලියන්න. *(ලකුණු 03 යි)*

1. (1) භූතාරූඪය (2) අධ්‍යාත්මික (3) අග්‍රගණ්‍ය (4) සමාජීය විද්‍යා (.........)

2. (1) ජාත්‍යාලය (2) අවස්ථෝචිත (3) ප්‍රදර්ශණය (4) විශ්ලේෂණය (.........)

3. (1) කොට්ඨාශය (2) ශීඝ්‍රතාව (3) පෞරුෂය (4) පශ්චාද්භාගය (.........)

● අංක **4** සිට **6** තෙක් එක් එක් ප්‍රශ්නය යටතේ දී ඇති වචන අකාරාදි පිළිවෙළට සකස් කළ විට නිවැරදිව දැක්වෙන අනුපිළිවෙළ තෝරා, ඊට අදාළ වරණයෙහි අංකය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති **තිත් ඉර** මත ලියන්න. *(ලකුණු 03 යි)*

4. අ. ක්‍රියාකාරීබලය ආ. කාර්යාවලිය ඉ. කාර්යසාධනය ඊ. කෘත්‍යාධිකාරිමණ්ඩලය
   (1) ඉ, ආ, ඊ, අ (2) අ, ආ, ඉ, ඊ (3) ඊ, ආ, ඉ, අ (4) අ, ඊ, ඉ, ආ (.........)

5. අ. සුචරිතය ආ. සුභනිමිත්ත ඉ. සුද්ධාවාස ඊ. සුගතිය
   (1) අ, ආ, ඊ, ඉ (2) අ, ඊ, ආ, ඉ (3) ඊ, අ, ඉ, ආ (4) ඉ, ඊ, අ, ආ (.........)

6. අ. ආලෝකය ආ. ආලෝකවර්ෂය ඉ. ආලෝකතරංග ඊ. ආලෝකකරණය
   (1) අ, ඊ, ආ, ඉ (2) අ, ආ, ඉ, ඊ (3) ආ, ඊ, අ, ඉ (4) ඊ, ඉ, අ, ආ (.........)

● අංක **7** සිට **9** තෙක් එක් එක් ප්‍රශ්නය යටතේ දී ඇති පද හතර අතුරින් නිවැරදිව විසන්ධි කර නොමැති පදය තෝරා, ඊට අදාළ වරණයෙහි අංකය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති **තිත් ඉර** මත ලියන්න. *(ලකුණු 03 යි)*

7. (1) සර්වාහරණ = සර්වා + හරණ (2) මිථ්‍යාචාර = මිථ්‍යා + ආචාර
   (3) නීත්‍යනුකූල = නීති + අනුකූල (4) අත්‍යලංකාර = අති + අලංකාර (.........)

8. (1) වාක්කෝෂ = වාච් + කෝෂ (2) තද්භව = තත් + භව
   (3) ගුරුතුමා = ගුරු + උතුමා (4) සමුපකාරය = සම + උපකාරය (.........)

9. (1) අන්‍යෝන්‍ය = අන්‍යඃ + අන්‍ය (2) නීලෝත්පල = නීල + උත්පල
   (3) මහාර්ෂි = මහා + ඍෂි (4) විද්‍යෝදය = විද්‍යා + ඕදය (.........)

● අංක **10** ප්‍රශ්නයට නිවැරදි පිළිතුර තෝරා, ඊට අදාළ වරණයෙහි අංකය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති **තිත් ඉර** මත ලියන්න. *(ලකුණු 01 යි)*

10. අකුරු ගළපන ලද කල්හි අර්ථවත් වචනයක් සැදෙන පිළිතුර කුමක් ද?
    (1) සනහානජහිය (2) විත්ඤාරලමය (3) පූළිර්යණිකත (4) බරන්ධරුන්ද (.........)

● අංක **11** සිට **15** තෙක් එක් එක් ප්‍රශ්නය යටතේ දී ඇති වාක්‍යය සදොස් වේ නම්, නිදොස් කොට **සම්පූර්ණ වාක්‍යයම තිත් ඉර** මත නැවත ලියන්න. නිදොස් වේ නම්, **'නිවැරදියි'** යන්න **පමණක්** ලියන්න. *(ලකුණු 05 යි)*

11. මා නීතිඥයෙක් වූ නිසා ගුරුතුමා සතුටු වූහ.

.................................................................................................................................

.................................................................................................................................

12. ළදරු පාසලට ළමයින් බඳවා ගනු ලැබේ.

.................................................................................................................................

.................................................................................................................................

[ 3 වන පිටුව බලන්න.

13. දෙවනපෑතිස් රජු විසින් සංඝමිත්තා තෙරණින් වහන්සේත් බෝධි ශාඛාවත් පිළිගන්නා ලදි.

.............................................................................................................................

.............................................................................................................................

14. දූ දරුවන් විසින් මහලු මෑණියන් රැකබලා ගන්නා ලදි.

.............................................................................................................................

.............................................................................................................................

15. ජී.බී. සේනානායකයන් නවකතාකරුවෙක් මෙන්ම විචාරකයෙක්ද විය.

.............................................................................................................................

.............................................................................................................................

- අංක **16** සිට **20** තෙක් එක් එක් ප්‍රශ්නය යටතේ දී ඇති පද අතුරින් නොගැළපෙන පදය තෝරා, ඊට අදාළ වරණයෙහි අංකය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති **තිත් ඉර** මත ලියන්න. *(ලකුණු 05 යි)*

16. (1) අශ්ව (2) තුරඟ (3) හය (4) වරණ (.........)

17. (1) ඉඟ (2) අඟ (3) කුනු (4) වෙර (.........)

18. (1) සුත (2) දරු (3) පුත් (4) සුනු (.........)

19. (1) යෙහෙළි (2) සිකි (3) මිතුරි (4) අඟන (.........)

20. (1) දිය (2) අඹ (3) පැන් (4) රළ (.........)

- අංක **21** සිට **25** තෙක් එක් එක් ප්‍රශ්නය යටතේ මුලින් දී ඇති **තද කළු අකුරින් මුද්‍රිත** යෙදුමට සමාන තේරුම් දෙන වාක්‍යාංශය හෝ පදය හෝ තෝරා, ඊට අදාළ වරණයෙහි අංකය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති **තිත් ඉර** මත ලියන්න. *(ලකුණු 05 යි)*

21. **දණ්ඩකින් පහර ලත් සර්පයකු සේ**
    (1) තැළී අඩපණ වූ (2) ප්‍රයෝජනයට ගත නොහැකි
    (3) කෝපයෙන් ඇවිස්සුණු (4) හොඳ නොහොඳ නොවැටහෙන (.........)

22. **ලුණු හොයන්ට ලේවායට ගියා වගෙයි**
    (1) නිශ්චිත ස්ථානය සොයා ගැනීම (2) නිෂ්ඵල ගමනක්
    (3) අවශ්‍ය දේ උපරිමව ලැබී තෘප්තිමත් වීම (4) යමක් මුල පටන් නිසි පරිදි වටහා ගැනීම (.........)

23. **කල දුටු කල, වළ ඉහ ගැනීම**
    (1) අවස්ථාවෙන් ප්‍රයෝජන ගැනීම (2) නිරර්ථක කාර්යයක නියැලීම
    (3) සිතීමට පවා අපහසු කටයුත්තක් ඉටු කිරීම (4) කෙනෙකු දුෂ්කරතාවට ඇද දැමීම (.........)

24. **කෝපි කාලෙ වැඩක්**
    (1) කෝපි වගාවට වැළඳෙන රෝගයක් (2) කෘෂිකර්මය හා සම්බන්ධ කෙම් ක්‍රමයක්
    (3) යල් පැන ගිය දෙයක් (4) කෝපි වගාව නගා සිටුවීමේ නව යෝජනාවලියක් (.........)

25. **ගුරු තරුව වැනි**
    (1) ගුරුවරුන් අතර දක්ෂයෙකි (2) ගුරුවරුන් සඳහා වන රක්ෂණ ක්‍රමයකි
    (3) ඉතා දීප්තිමත් (4) බලසම්පන්න රාජ යෝගයක් සහිත ග්‍රහ පිහිටීමකි (.........)

[ 4 වන පිටුව බලන්න.

- අංක **26** සිට **30** තෙක් එක් එක් ප්‍රශ්නය යටතේ මුලින් දී ඇති තද කළු අකුරින් මුද්‍රිත පදයට සමානාර්ථයක් නොදෙන පදය තෝරා, ඊට අදාළ වරණයෙහි අංකය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති තිත් ඉර මත ලියන්න. *(ලකුණු 05 යි)*

26. **ඇඳුරු**
(1) පර්වතය (2) බලි අරින්නා (3) කුළුබඩු විශේෂයක් (4) ආචාර්යවරයා (.........)

27. **කිරණ**
(1) රශ්මිය (2) බැබළීම (3) කිරිමුහුද (4) බරමැනීම (.........)

28. **නා**
(1) නාගයා (2) නාමය (3) හස්තියා (4) නායක (.........)

29. **පහ**
(1) ප්‍රසාදය (2) ස්පර්ශය (3) ප්‍රාසාදය (4) පංචකය (.........)

30. **ලිය**
(1) ලේඛනය (2) දලු (3) ස්ත්‍රිය (4) වැල (.........)

- අංක **31** සිට **35** තෙක් එක් එක් ප්‍රශ්නය යටතේ දී ඇති එක් එක් වාක්‍යාංශයෙහි නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ අර්ථය දෙන වරණය තෝරා, එහි අංකය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති තිත් ඉර මත ලියන්න. *(ලකුණු 05 යි)*

31. මුදුන් පත් වීම
(1) ජයග්‍රහණය ලැබීම (2) ප්‍රධානත්වය හිමි වීම
(3) නායකත්වය ලැබීම (4) ඉටු වීම (.........)

32. සායම අරිනවා
(1) වර්ණ විරඤ්ජනය (2) රෙදි සෝදා වියළීම
(3) ගෞරවය හීන කිරීම (4) චිත්‍රයක අනවශ්‍ය වර්ණ ඉවත් කිරීම (.........)

33. බහින කලාව
(1) කලාත්මක ලෙස සකස් කළ පියගැට පෙළ
(2) පරිහාණිය
(3) විවෘත ආර්ථිකය නිසා කලාව පිරිහීම
(4) කලාකරුවන් අතර මත භේද (.........)

34. ඇගේ එල්ලෙනවා
(1) උදවු - උපකාර ලබා ගැනීම (2) අත්අඩංගුවට ගැනීම
(3) ප්‍රේම සම්බන්ධයක් ඇරඹීම (4) සර්පයෙකු දෂ්ට කිරීම (.........)

35. ඇඟ බේරා ගැනීම
(1) බෝවෙන සමේ රෝගයක් සුව වීම
(2) වරදකට හසු නොවී සිටීම
(3) රාජකාරිවලින් මඟ හැර සිටීම
(4) ඇඟ බද්ද ගෙවීමෙන් නිදහස ලැබීම (.........)

**36.** පහත සඳහන් පාඨය කියවා, අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න. *(ලකුණු 03 × 5 = 15 යි)*

අනුරාධපුරයේ පිරිහීම ලංකාවේ දේශපාලන ඉතිහාසයේ පමණක් නොව විද්‍යාවේ සහ කාර්මික ඥානයේත් පරිච්ඡේදාවසානයකි. බලය අල්ලා ගැනීමේ පරමාර්ථය මුල් කොට ගෙන දකුණු ඉන්දියා රාජ්‍යයන් අතර පැවති පොරයේ ආරවුල්වලට සහ තරගවලට අභාග්‍යසම්පන්න ලෙස ලංකාව මැදිහත් වීමෙන් උද්ගත වූ නොසන්සුන් දේශපාලන තත්ත්වයෙන් හොඳින් පෙනෙන පරිහානි ස්වරූපය අනුරාධපුර යුගයේ අවසාන භාගයේ පැහැදිලි ලෙසම දැකිය හැකිය. ලංකා ඉතිහාසයේ ඕනෑම වකවානුවක පැවති ස්ථිරභාවය සහ දියුණුව වාරි කර්මාන්තයෙන් හා ආගමික සිහිවටනයන්ගෙන් මැනේ නම් නවවැනි, දහවැනි ශතවර්ෂවල එබඳු කර්මාන්ත හෝ සිහිවටන හෝ නොමැති වීමෙන් පෙනී යන්නේ එකී අර්බුදකාරී ශතවර්ෂවලදී ලංකාවේ තත්ත්වය සතුටුදායක නොවූ බවයි.

දකුණු ඉන්දියා දේශපාලන කටයුතුවලට මැදිහත් වීමෙන්ද, එසේ මැදිහත් වීමේ ප්‍රතිඵල ලෙස ජාතික ධනය සහ ශක්තිය පිරිහී ගොස් හටගත් ආභ්‍යන්තරික දේශපාලන පරිහානියෙන්ද, උද්ගත වූ විරුද්ධතාව නිසා, ලංකාව, ව්‍යාප්ත වෙමින් පැවති චෝළ අධිරාජ්‍ය බලයට නිරායාසයෙන්ම ගොදුරු විය. දකුණු ඉන්දියා ද්‍රවිඩ ශිෂ්ටාචාරය සමග ශතවර්ෂ දෙකතුනක් තිස්සේ පැවති ඉතා කිට්ටු සම්බන්ධකම්, උනුන්ගේ මත සහ දක්ෂකම් කෙරෙහි සෑහෙන අන්‍යෝන්‍ය බලපෑමකට හේතු විය යුතුව තිබිණි. ඒ බලපෑම ලංකාවේ විද්‍යාවේ සහ කාර්මික කෞශල්‍යයේ සෑහෙන ලෙස සලකුණු වන්නටද ඉඩ තිබිණි. ලංකාව චෝළ බලයට අවනත වීමත් සමගම හින්දු ආගම බුද්ධාගම කෙරෙහිද, දෙමළ භාෂාව සිංහල භාෂාව කෙරෙහිද බලපෑ ආකාරය අපට පැහැදිලිය. ලංකාවේ ස්වාධිපත්‍යයෙහි ආරක්ෂකයා ලෙස ප්‍රසිද්ධියට පත් I විජයබාහු රජුගේ කාලයේදී, පවා දෙමළ භාෂාවෙන් සෙල්ලිපියක් පළ කොට තිබීම විශේෂ කාරණයකි. විජයබාහුගෙන් පසු රජ පැමිණියවුන්ගේ කාලවලදීද ඇතැම් රාජාඥා දෙමළ භාෂාවෙන් ශිලාලේඛනගතව ඇත. "ඒවා දියුණුවේ සංකේතයක් ලෙස සලකනු ලැබිය."යි ආචාර්ය සෙනරත් පරණවිතාන අදහස් කරයි.

එහෙත් විද්‍යාව සහ කාර්මික කෞශල්‍යය කෙරෙහි එතරම් බලපෑමක් අපට දැකිය නොහැකිය. මේ පරස්පර විරෝධයට හේතු දෙකක් දැක්විය හැකිය. ඉන් එක් හේතුවක් නම් නිදහස ලැබීම සඳහා සිංහලයන් දැරූ ප්‍රයත්නය මැඩලමින් ලංකාවේ චෝළ බලය අස්ථිර, අවදානම් තත්ත්වයක පැවතීමයි. මේ තත්ත්වය නිසා ලංකාවේ විද්‍යාවේ සහ කාර්මික කෞශල්‍යයේ උරුමයට අලුතින් යමක් එකතු කිරීමට ඔවුන්ට අවස්ථාවක් නොලැබුණේය. දෙවැන්න නම් එකල දකුණු ඉන්දියා ශිෂ්ටාචාරය උච්චාවස්ථාවට පත්ව තිබුණද අනුරාධපුර යුගයේදී ස්වාධීන ලෙස සංවර්ධනයට පත් ලංකා ශිෂ්ටාචාරයට දීමට තරම් දෙයක් එහි නොවීමයි. සිංහලයන්ගේ දියුණු ශිලා කර්මාන්ත සහ ලෝහ කර්මාන්ත පිළිබඳව මේ කියමන වඩාත් ගැළපේ. පොලොන්නරුවේ අංක 2 ශිව දේවාලයයේ ශිලා කර්මාන්ත ආචාර්ය සෙනරත් පරණවිතාන කියන පරිදි චෝල ගෘහ නිර්මාණයේ උසස්ම කෘති වෙතත් ඒවා අනුරාධපුර යුගයේ බෞද්ධ ශිලා කර්මාන්ත අසලකවත් තැබිය නොහේ. එසේම නිසැකයෙන්ම දකුණු ඉන්දියාවේ තනන ලද ශිව නටරාජ රූපය, සුන්දර මූර්තිස්වාමි රූපය වැනි කුඩා ලෝකඩ පිළිම, තාරා පිළිමය තරම් කාර්මික කෞශල්‍යයක් නොපෙන්වයි.

වංශකථාවන්හි සඳහන් වන්නේ දකුණු ඉන්දියා ආක්‍රමණ සහ ඒවායේ විනාශකාරී ප්‍රතිඵල පමණකි. සිංහල කාර්මික විද්‍යාඥයෝද ශිල්පීහුද රාජකීය අනුග්‍රහ නොලද්දාහු ස්වකීය වෘත්තීන් දියුණු කරගැනීමට අවස්ථාවක් නොලැබූහ. අනුරාධපුර යුගයේ කාර්ය බහුල කාල පරිච්ඡේදයත් චෝළයන් ලක්දිවින් නෙරපා හැරීමත් අතර වූ දීර්ඝ කාලය තුළ සිංහලයන්ගේ පැරණි කාර්මික ඥානය සහ කෞශල්‍යය රැක ගනිමින් පරම්පරාවෙන් පරම්පරාවට ගෙන ආවේ කෙසේද යනු ප්‍රශ්නයට කරුණකි. ශතවර්ෂ කීපයක් වූ මේ අතර කාලය තුළදී අනුරාධපුර සම්ප්‍රදාය නොකඩවා ගෙන ආ බවට කෙළින්ම ලද හැකි සාක්ෂ්‍ය නැතත් එසේ ගෙන ඒමෙන් එක් කරුණක් නම් තදින්ම පැහැදිලිය. එනම්, ආධුනිකයන් සහ නවක ශිල්පීන් පුහුණු කරනු පිණිස උපයෝගි කරගන්නා ලද ශ්‍රේණි වශයෙන් හෝ කුල වශයෙන් සිදු වූයේ ඔවුන්ගේ විශේෂඥ දැනීම ආරක්ෂා වීමයි. ඒ දැනීම මීට පෙර යුගයේ ආධුනිකයනට ලැබුණේ කර්මාන්ත කිරීමේදීමය. එහෙත් එබඳු අවස්ථා නොලත් මේ අවධියේද ඔවුන් ඒ සඳහා භාවිත කළ ක්‍රම අද දවසේ අපට දැනගන්නට ඇත්නම් කාර්මික විද්‍යා අධ්‍යාපනයේ සංවර්ධනයට ඉවහල් වනු ඇත.

[ 6 වන පිටුව බලන්න.

(i) දිවයිනේ පැවති දේශපාලන ස්ථාවරත්වය හා දියුණුව මනින සාධක වශයෙන් මෙහි දැක්වෙන්නේ කවරක්ද?

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................

(ii) දකුණු ඉන්දියානු බලපෑම විද්‍යා හා කාර්මික දියුණුවට හේතු නොවූයේ ඇයි?

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................

(iii) චෝළ හා දකුණු ඉන්දියානු නිර්මාණ සසඳා ඇත්තේ කවර දේශීය නිර්මාණ සමගද?

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................

(iv) කාර්මිකයන්ගේ හා ශිල්පීන්ගේ විශේෂඥ දැනුම ආරක්ෂා වූයේ කවර හේතු නිසාද?

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................

(v) කාර්මිකයන්ට හා ශිල්පීන්ට ඔවුන්ගේ වෘත්තීන් දියුණු කර ගැනීමට අවස්ථා නොලැබුණේ මන්දැයි දක්වන්න.

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................

.......................................................................................................................

[ 7 වන පිටුව බලන්න.

**37.** පහත දැක්වෙන පාඨය කියවා එහි වචන සංඛ්‍යාවෙන් තුනෙන් එකක් පමණ වන සේ සාරාංශ කොට ලියා, යෝග්‍ය මාතෘකාවක්ද යොදන්න. ඔබ ලියූ වචන සංඛ්‍යාව සාරාංශය අවසානයේ සඳහන් කරන්න. *(ලකුණු 20 යි)*

පෘතුගීසි භාෂාව, එහි සංකර ස්වභාවයෙන් වුවද ලංකාවේ අද භාවිත නොවන තත්ත්වයකට පත්ව ඇත. එහෙත් එය, ජාතික භාෂා කෙරෙහි නොමැකෙන බලපෑමක් ඇති කර තිබේ. පෘතුගීසියෙන් ඇඳා ගත් බොහෝ වචන දැනුදු සිංහල, දෙමළ භාෂාවල දිනපතා භාවිත වේ. පෘතුගීසීන් රටේ භාෂා ඉගෙන ගැනීම වෙනුවට ඇත්ත වශයෙන් සිදු වූයේ පෘතුගීසීන් සහ ලාංකිකයන් අතර සමීප ආශ්‍රය නිසා පෘතුගීසිය වඩා බහුල ලෙස කථා කිරීම සහ එහි ප්‍රතිඵලයෙන් එය ජාතික භාෂා කෙරෙහි ආභාසයක් ඇති කිරීමය. එහෙත් ඒ අතරම සමහර සිංහල වචනත් දෙමළ වචනත් දේශීය ඉන්දු-පෘතුගීසි භාෂාවට එක් වී ඇති බව මතක තබා ගත යුතුය.

මුල් මිෂනාරීහු පරිවර්තකයන්ගේ සහාය ඇතිව ක්‍රිස්තියානි ධර්මය දේශනා කළහ. මෙය අසතුටුදායක ක්‍රමයක් හැටියට මිෂනාරීන්ටම වැටහුණු බවට සැකයක් නැත. පරිවර්තකයන් මගින් ඉගැන්වීම කිසිසේත්ම ප්‍රමාණවත් නොවූ බව සාන්ත ප්රැන්සිස් සාවියර් තුමා තරම් අවබෝධ කරගත් අන් කිසිවෙක් නොවීය. එතුමාට එය අවබෝධ වූයේ තමා නොදත් භාෂා කථා කළ ජනයා සමග කථා බස් කිරීමේ ප්‍රශ්නයට මුහුණ පෑමට එතුමාගේ පෙරදිග ධර්මදූත දේශාටනවලදී (1542 - 1552) සිදු වූ විටය. එහෙයින් මිෂනාරීන් භාෂා හොඳින් දැන ගැනීමේ වැදගත්කම ගැන හේ ඇඩි ලෙස කියා සිටියේය.

පෙරදිග භාෂා ඉගෙන ගැනීම මිෂනාරීන්ට නිසැකයෙන්ම පහසු කරුණක් නොවීය. ආසියාවේ භාෂා හැදෑරීම සඳහා යුරෝපීය භාෂාවලින් ලියැවුණු පොත් එකෙක් නොවූ හෙයින් මුල් මිෂනාරීන්ට ඉගෙනීමට සිදු වූයේ වෙහෙස ගෙන දෙන ක්‍රමයක් වූ භාෂාව කථා කිරීමෙනි. පසු කාලයේ පැමිණි මිෂනාරීන්ගේත් වෙනත් ශිෂ්‍යයන්ගේත් ප්‍රයෝජනය සඳහා ව්‍යාකරණ ග්‍රන්ථත් ශබ්දකෝෂත් සම්පාදනය කිරීමේ කාර්යයට මුල පිරුවෝ ඇත්ත වශයෙන් මේ මිෂනාරීහුමය.

පොත් නොතිබීම හැරුණු විට මිෂනාරීන්ට මුහුණ පෑමට සිදු වූ තවත් දුෂ්කරතා තිබුණේය. මෙරට භාෂාත් ඔවුන්ගේ භාෂාවත් අතර පැවති මහත් අසමානතාව මේ දුෂ්කරතාවලින් සුළු එකක් නොවීය. මෙරට භාෂාවල වචනමාලාව යුරෝපීය ජාතිකයාට මහත් බාධාවක් විය. උච්චාරණය ද එබඳුම විය. ඒ කාලයේ පෘතුගීසි වාර්තාවල සංඥා නාම ලියා ඇති ආකාරය නිදසුනක් වශයෙන් ගත හැකිය.

ඒ කෙසේ වෙතත් ජාතික භාෂා හැදෑරීමට මිෂනාරීන් උත්සාහයක් ගත් බව අපට පෙනේ. එලෙස කිරීමට ඔවුන් පෙලඹුණේ දේශීය ජනතාව අතර ක්‍රිස්තියානි ධර්මය ව්‍යාප්ත කරලීමට ඔවුන් තුළ පැවති බලවත් ආශාව නිසයි. ලංකාවේ එකල පැවති මිෂනාරි නිකායයන් අතුරින් සිංහලත් දෙමළත් හැදෑරීමට වැඩිම උනන්දුව දැක්වූවෝ ජේසු නිකායිකයෝය. ඔවුන් ලැබූ පුහුණුවත් අධ්‍යාපනය සම්බන්ධයෙන් දැක්වූ සැලකිල්ලත් නිසා ඔවුහු, මිෂනාරීන් අතර උගත්කමට වැඩිම කැමැත්ත දැක්වූ කොටස වූහ.

| | | | | |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

[ 8 වන පිටුව බලන්න.

**38.** පහත දැක්වෙන මාතෘකාවලින් එකක් තෝරා ගෙන, වචන **300** ක් පමණ වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ලියන්න. *(ලකුණු 30 යි)*

(i) ජනවාර්ගික සහජීවනයෙහි ලා භාෂාව හා සාහිත්‍යය යොදා ගැනීම

(ii) අධ්‍යාපනයේ ගුණාත්මකභාවය හා පෞද්ගලික විශ්වවිද්‍යාල පිහිටුවීම

(iii) උතුරු කොරියා - එක්සත් ජනපද නායක හමුව හා ආසියාවේ අනාගතය

(iv) අල්ලස හා දූෂණය වැලැක්වීම සඳහා නීතියේ හා චිරන්තන සම්ප්‍රදායේ වැදගත්කම

[ 10 වන පිටුව බලන්න.

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

.......................................................................................................................................................

***

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

# ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ 2019 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් ඇතුළත්කර ගැනීම සඳහා පවත්වනු ලබන තරග විභාගය - 2018 සැප්තැම්බර්

## (02) සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය

පැ දෙකයි

## I කොටස - සාමාන්‍ය දැනීම

### විභාග අපේක්ෂකයින්ට උපදෙස්

ඉතා වැදගත් :

පිළිතුරු ලිවීම සඳහා පැන්සල භාවිත නොකරන්න.



✳ පිළිතුරු සැපයීමේ දී පහත සඳහන් ආකාරයට ඉලක්කම් ලියා නැති උත්තර පත්‍ර ඇගයීමට ලක් නොකෙරේ.

**1 2 3 4**

ඔබේ විභාග අංකය මෙහි ද තුන්වන පිටුවෙහි ඇති කිත් ඉර මත ද ලියන්න.

.................................

නිවැරදි බවට නිරීක්ෂකගේ කෙටි අත්සන

.................................

වැදගත් :

✳ විෂය අංක (02) සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය ප්‍රශ්න පත්‍රය, I කොටස - සාමාන්‍ය දැනීම හා II කොටස - බුද්ධි පරීක්ෂණය වශයෙන් කොටස් දෙකකින් යුක්ත වේ.

✳ එම කොටස් දෙකට ම නියමිත කාලය පැය දෙකකි.

✳ මෙම I කොටස - සාමාන්‍ය දැනීම ප්‍රශ්න පත්‍රය පිටු **06** කින් හා ප්‍රශ්න **50** කින් යුක්ත වේ.

✳ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.

✳ ශාලාධිපතිවරයා නිවේදනය කළ පසු පිළිතුරු ලිවීම ආරම්භ කරන්න.

✳ දී ඇති උපදෙස් අනුව ම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු වන අතර උපදෙස්වලට පටහැනිව සපයන පිළිතුරු සඳහා ලකුණු දෙනු නොලැබේ.

✳ ඔබට සැපයීමට පිළිතුරු නැතත් මෙම පිළිතුරු පත ශාලාධිපතිට භාර දිය යුතු ය.

✳ ඔබේ පිළිතුරු පැහැදිලි ලෙස නිල් හෝ කළු පැනෙන් පමණක් ලියන්න. පැන්සල් පාවිච්චි නොකරන්න.

✳ මෙම ප්‍රශ්න පත්‍රය විභාග ශාලාවෙන් පිටතට ගෙන යාම හෝ එහි ඡායා පිටපත් ගැනීම හෝ වරදකි.

✳ අපැහැදිලි ඉලක්කම්, අපැහැදිලි අත් අකුරු සහිත, මකන දියර භාවිත කරන ලද සහ පැන්සලෙන් පිළිතුරු සපයන ලද පිළිතුරු පත්‍ර ඇගයීමට ලක් නොකෙරේ.

පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි

| පිටුව | ප්‍රශ්න අංකය | ලැබූ ලකුණු |
|---|---|---|
| 2 | 1 - 11 | |
| 3 | 12 - 21 | |
| 4 | 22 - 30 | |
| 5 | 31 - 44 | |
| 6 | 45 - 50 | |
| එකතුව | | |

අවසාන ලකුණු

| | |
|---|---|
| ඉලක්කමෙන් | |
| අකුරින් | |

| | |
|---|---|
| උත්තර පත්‍ර පරීක්ෂක 1 | |
| උත්තර පත්‍ර පරීක්ෂක 2 | |
| ඇගයීම් ලකුණු පරීක්ෂක | |
| ප්‍රධාන පරීක්ෂක | |

[ 2 වැනි පිටුව බලන්න.

● අංක 1 සිට 30 තෙක් එක් එක් ප්‍රශ්නයට නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ වඩාත් ආසන්න හෝ පිළිතුර තෝරා, ඊට අදාළ වරණයෙහි අංකය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති තිත් ඉර මත ලියන්න.

1. ශ්‍රී ලංකාවේ වර්ග ප්‍රමාණය වර්ග කිලෝ මීටරවලින් කොපමණ ද?
(1) 65,610 (2) 66,360 (3) 67,630 (4) 68,410 (………)

2. 2017 ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව අනුව, ශ්‍රී ලංකාවේ ශ්‍රම බලකායේ අනුපාතිකයක් ලෙස 2017 වර්ෂයේ පැවති සේවා වියුක්ති අනුපාතය කීය ද?
(1) 3.1% (2) 4.2% (3) 4.8% (4) 5.1% (………)

3. එක්සත් රාජධානියේ ග්‍රාහකයකුගේ දුරකථන අංකයක් විය හැක්කේ පහත දැක්වෙන කවරක් ද?
(1) +44 7404030651 (2) +91 7404030651
(3) +33 7404030651 (4) +61 7404030651 (………)

4. 2017 ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව අනුව 2017 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ දළ මරණ අනුපාතිකය දහසකට කොපමණ ද?
(1) 16.5 (2) 14.1 (3) 8.5 (4) 6.5 (………)

5. ශ්‍රී ලංකාවේ වයඹ දිග ප්‍රදේශවල ඇති හුණුගල් නිධි නිර්මාණය වූයේ භූ ඉතිහාසයේ කවර යුගයක ද?
(1) ප්ලයෝසීන යුගය (2) ප්ලයිස්ටෝසීන යුගය
(3) මයෝසීන යුගය (4) ඔලිගෝසීන යුගය (………)

6. 2017 ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව අනුව, 2017 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයට වැය කරන ලද මුදල දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස ගත් කල,
(1) 1.2% කි. (2) 1.9% කි. (3) 3.5% කි. (4) 6.2% කි. (………)

7. මඤ්ඤොක්කා සමග ඉඟුරු එකතු වීමෙන් ශරීරයේ විෂ සහිත තත්ත්වයක් ඇති වන්නේ කවර රසායනයක් ප්‍රකට වීමෙන් ද?
(1) පොටෑසියම් (2) ආසනික් (3) සයනයිඩ් (4) මැග්නීසියම් (………)

8. මෑත දී නිමා වූ ආසියාතික ක්‍රීඩා තරගාවලිය පැවැත්වූයේ කවර රටක ද?
(1) ඉන්දියාව (2) තායිලන්තය (3) ඉන්දුනීසියාව (4) පිලිපීනය (………)

9. ටයික්වොන්ඩෝ (Taekwondo) ක්‍රීඩාව කවර රටක උපත ලැබුවේ ද?
(1) චීනය (2) දකුණු කොරියාව
(3) තායිලන්තය (4) ජපානය (………)

10. 2017 ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව ප්‍රකාර ව, ශ්‍රී ලංකාව පාකිස්ථානය සමග අත්සන් කරන ලද නිදහස් වෙළෙඳ ගිවිසුම යටතේ 2017 වර්ෂයේ දී ශ්‍රී ලංකාව පාකිස්ථානයට අපනයනය නොකළ භාණ්ඩයක් වන්නේ පහත කවරක් ද?
(1) තේ (2) බුලත්
(3) රබර් නිෂ්පාදිත භාණ්ඩ (4) කරාබු නැටි (………)

11. 2017 ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව අනුව, 2017 වර්ෂයේ දී මෙරටට විදේශිකයන් පැමිණි ප්‍රමාණය රටවල් අනුව අවරෝහණ ක්‍රමයට පෙළගැස් වූ විට නිවැරදි වන්නේ කුමක් ද?
(1) ඉන්දියාව, එක්සත් රාජධානිය, චීනය, ජර්මනිය
(2) චීනය, ඉන්දියාව, එක්සත් රාජධානිය, ජර්මනිය
(3) චීනය, එක්සත් රාජධානිය, ජර්මනිය, ඉන්දියාව
(4) ඉන්දියාව, චීනය, එක්සත් රාජධානිය, ජර්මනිය (………)

[ 3 වැනි පිටුව බලන්න.

12. 'ව්‍යභිචාරය (Incest)' යටතේ වරදක් වන්නේ පහත සඳහන් කවරක් ද?
   (1) ළමයින් ලිංගික අපයෝජනයට ලක් කිරීම
   (2) කප්පම් ගැනීමේ අරමුණෙන් ළමයින් අපහරණය කිරීම
   (3) දෙමාපියන්ගෙන් එක් පාර්ශ්වයක සීයා තම මිණිබිරිය සමග ලිංගික සංසර්ගයේ යෙදීම
   (4) මානසික ආබාධයක් නිසා නිසි වැටහීමක් නැති ස්ත්‍රියක් සමග ලිංගික සංසර්ගයේ යෙදීම (.........)

13. සැකකරුවෙකු පොලිසිය විසින් අත්අඩංගුවට ගැනීමෙන් පසු මහේස්ත්‍රාත්වරයකු ඉදිරියට පැමිණවිය යුත්තේ,
   (1) පැය 12 ක් ඉක්මවීමට පෙර ය. (2) පැය 24 ක් ඉක්මවීමට පෙර ය.
   (3) පැය 72 ක් ඉක්මවීමට පෙර ය. (4) මූලික විමර්ශන අවසන් කළ වහාම ය. (.........)

14. කලින් වීසා ලබා ගැනීමෙන් තොර ව ශ්‍රී ලාංකිකයකුට පිවිසිය හැකි රටක් වන්නේ,
   (1) ඉන්දියාව ය. (2) කුවේට් ය.
   (3) සවුදි අරාබිය ය. (4) සිංගප්පූරුව ය. (.........)

15. 'Residency' යන පදය මෙරට භාවිත වන්නේ කවුරුන් පදිංචි ව සිටින නිල නිවාසයකට ද?
   (1) දිසාපති (2) කථානායකවරයා
   (3) අග්‍රවිනිශ්චයකාරවරයා (4) නීතිපතිවරයා (.........)

16. රාජ්‍යයක බලතල බෙදීමේ සිද්ධාන්තය ඉදිරිපත් කරනු ලැබුවේ කවුරුන් විසින් ද?
   (1) ඩයිසි (Dicey) (2) ජස්ටිනියන් (Justinian)
   (3) ඇරිස්ටෝටල් (Aristotle) (4) මොන්ටෙස්ක්‍යු (Montesquieu) (.........)

17. මානව ඉතිහාසයේ මුල් වරට ස්වකීය භාවිතය සඳහා මෙවලම් තනා ගත් මිනිස් වර්ගය කුමක් ද?
   (1) හෝමෝ ඉරෙක්ටස් (Homo erectus)
   (2) හෝමෝ නියැන්ඩර්තාලෙන්සිස් (Homo neanderthalensis)
   (3) හෝමෝ හැබිලිස් (Homo habilis)
   (4) ඔස්ට්‍රේලොපිතෙකස් (Australopithecus) (.........)

18. ගුවන් විදුලි තරංග පිළිබඳ ව්‍යවහාරයේ එන 'AM' යන කෙටි යෙදුම බිහි වී තිබෙන්නේ පහත සඳහන් කවරක් මුල් කරගෙන ද?
   (1) Angelo Marconi (2) Anno Madian
   (3) Ampheres (4) Amplitude Modulation (.........)

19. ශ්‍රී ලංකාව හැරුණු විට රෝම ලන්දේසි නීතිය (Roman Dutch Law) භාවිත වන රටක් වන්නේ,
   (1) ඕලන්දයයි. (2) දකුණු අප්‍රිකාවයි.
   (3) බ්‍රසීලයයි. (4) ඉන්දුනීසියාවයි. (.........)

20. 1947 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් මෙරට සුළු ජාතීන්ගේ අයිතිවාසිකම් සුරැකීමට විධිවිධාන සලසා ඇතැයි සලකනු ලබන්නේ එහි කවර වගන්තියකින් ද?
   (1) 14 වැනි වගන්තිය (2) 32 වැනි වගන්තිය
   (3) 29 වැනි වගන්තිය (4) 43 වැනි වගන්තිය (.........)

21. සංයුක්ත තැටියක (CD) දත්ත ගබඩා කළ හැකි උපරිම ධාරිතාව කොපමණ ද?
   (1) 200 MB (2) 300 MB (3) 500 MB (4) 700 MB (.........)

22. කිසියම් සේවායෝජකයකු විසින් සේවකයකු සේවයෙන් පහ කරනු ලැබූ අවස්ථාවක එකී සේවකයා කම්කරු විනිශ්චය සභාවකින් සහනයක් පතන්නේ නම්, ඒ සඳහා පැමිණිලි කළ යුත්තේ,
    (1) දින 30 ක් ඉක්මවීමට පෙර ය. (2) සති 06 ක් ඉක්මවීමට පෙර ය.
    (3) මාස 03 ක් ඉක්මවීමට පෙර ය. (4) මාස 06 ක් ඉක්මවීමට පෙර ය. (………)

23. 1815 දී අත්සන් කළ උඩරට ගිවිසුම ප්‍රධාන වශයෙන් කෙටුම්පත් කරනු ලැබූ පුද්ගලයා ලෙස සැලකෙන්නේ කවුරුන් ද?
    (1) ජෝන් ඩොයිලි (John D'oyly) (2) රොබර්ට් බ්‍රවුන්රිග් (Robert Brownrigg)
    (3) කැමරන් (Cameron) (4) හෙන්රි ටේලර් (Henry Tailor) (………)

24. මෙරට අධිකරණ මගින් දෙන ලද නඩු තීන්දු සම්බන්ධයෙන් බ්‍රිතාන්‍යයේ ප්‍රිවි (Privy) කවුන්සලය අවසාන අභියාචනාධිකරණය වශයෙන් ක්‍රියා කිරීම අවසන් වූයේ,
    (1) 1933 දී ය. (2) 1948 දී ය. (3) 1972 දී ය. (4) 1978 දී ය. (………)

25. මෑත දී අභාවප්‍රාප්ත වූ හිටපු ඉන්දීය අගමැති අතල් බිහාරි වජ්පායි මහතාගේ ධුර කාලය සම්බන්ධයෙන් සත්‍ය නොවන්නේ පහත දැක්වෙන කුමක් ද?
    (1) ඔහුගේ පාලන කාලය තුළ ඉන්දියාව හා පාකිස්ථානය අතර යුද ගැටුමක් ඇති නොවී ය.
    (2) ඔහු තුන්වරක් ඉන්දියාවේ අගමැති ධුරය හෙබවී ය.
    (3) ඔහු ඉන්දියාව හා පාකිස්ථානය අතර දුම්රිය සේවාවක් ඇති කිරීමට මුල් විය.
    (4) පාකිස්ථානයට එරෙහි කාගිල් යුද්ධයේ දී ඔහු ඉන්දියාවට නායකත්වය සැපයී ය. (………)

26. ලෝක වෙළෙඳපොළේ ශ්‍රී ලංකාවේ තේ අපනයනයට වර්තමානයේ ඇති බලවත් ම තරගකරුවන් කවුරුන් ද?
    (1) ඉන්දුනීසියාව සහ තුර්කිය (2) ඉන්දියාව සහ කෙන්යාව
    (3) ඉන්දියාව සහ චීනය (4) චීනය සහ කෙන්යාව (………)

27. වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ මුලින් 'ජාතික භාෂාවක්' වශයෙන් පැවති දෙමළ භාෂාව 'රාජ්‍ය භාෂාවක්' බවට පත් කෙරුණේ ඊට ගෙන එන ලද කවර ව්‍යවස්ථා සංශෝධනයෙන් ද?
    (1) 6 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන්
    (2) 12 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන්
    (3) 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන්
    (4) 16 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් (………)

28. මීයන්ගේ මුත්‍රා විෂබීජයක් වශයෙන් මිනිස් සිරුරට ඇතුළු වීම නිසා වැළඳෙන රෝගය කවර නමකින් හැඳින්වේ ද?
    (1) ලෙප්ටෝස් පයිරෝසිස් (2) මෙනින්ජයිටිස්
    (3) චිකුන්ගුන්යා (4) ටොක්සොප්ලාස්මොසිස් (………)

29. 2017 ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව අනුව ජංගම දුරකතන ද ඇතුළත් ව 2017 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ පුද්ගලයින් භාවිත කරන ලද දුරකතන ප්‍රමාණයේ අනුපාතය කොපමණ ද?
    (1) පුද්ගලයින් 100 කට දුරකතන 88 (2) පුද්ගලයින් 100 කට දුරකතන 126
    (3) පුද්ගලයින් 100 කට දුරකතන 184 (4) පුද්ගලයින් 100 කට දුරකතන 143 (………)

30. චූදිතයකු විසින් කරනු ලබන පාපෝච්චාරණයක් නීතියෙන් පිළිගැනෙන්නේ එය කවුරුන් ඉදිරිපිට කරන ලද විට දී ද?
    (1) සාමදාන විනිශ්චයකාරවරයකු
    (2) මහේස්ත්‍රාත්වරයකු
    (3) දිවුරුම් කොමසාරිස්වරයකු වන නීතිඥවරයකු
    (4) සහකාර පොලිස් අධිකාරිවරයකුගේ නිලය හෝ ඊට ඉහළ නිලයක් දරන පොලිස් නිලධාරියකු (………)

[ 5 වැනි පිටුව බලන්න.

● අංක **31** සිට **50** තෙක් එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර දී ඇති තිත් ඉර මත ලියන්න.

31. රාජ්‍ය මුදල් අවභාවිත කිරීම, අල්ලස්, දූෂණ හා අක්‍රමිකතා සොයා බලා නීතිය ක්‍රියාත්මක කිරීමට මෑත දී පිහිටුවන ලද විශේෂ මහාධිකරණයේ ත්‍රිපුද්ගල විනිශ්චය සභාවේ සභාපතිවරයා කවුරුන් ද?

..................................................................................................................................

32. 2017 වර්ෂයේ දී මෙරට මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනයට දැඩි අහිතකර බලපෑමක් එල්ල කරමින් ඉස්සන්ට සෑදුණු රෝගය කවර නමකින් හැඳින්වේ ද?

..................................................................................................................................

33. මාතලේ දිස්ත්‍රික්කයේ 'ඉබ්බන්කටුව' ප්‍රදේශයෙන් හමු වූ පුරාවිද්‍යාත්මක නටබුන්වලින් තහවුරු වී ඇත්තේ කවරක් ද?

..................................................................................................................................

34. "නීතියේ ආධිපත්‍යය පිළිබඳ සිද්ධාන්තය (Rule of Law)" හඳුන්වා දුන්නේ කවුරුන් ද?

..................................................................................................................................

35. 'ලෝකයේ සැඟවුණු අට වැනි මහාද්වීපය' භූ විද්‍යාඥයින් හඳුන්වන්නේ කවර නමකින් ද?

..................................................................................................................................

36. ශ්‍රී ලංකාව සහ චීනය අතර ඓතිහාසික රබර්-සහල් ගිවිසුමට ශ්‍රී ලංකාව වෙනුවෙන් අත්සන් තැබුවේ කවුරුන් ද?

..................................................................................................................................

37. 'ඩෙසිබල්' ඒකකය භාවිත කරනුයේ කවරක් මැනීමට ද?

..................................................................................................................................

38. පරිපාලන අධිකාරියක් හෝ රාජ්‍ය නිලධාරියකු විසින් ඉටු කිරීමට බැඳී ඇති යම් කටයුත්තක් ඉටු කරවීමට විධානයක් කරන ලෙස අභියාචනාධිකරණයෙන් අයැද සිටිය හැකි රිට් (Writ) ආඥාව කුමක් ද?

..................................................................................................................................

39. ලංකා ඉතිහාසයේ සඳහන් පරිදි ඉන්දියාවේ කාලිංග දේශයට එරෙහිව යුද්ධ ප්‍රකාශ කළ සිංහල රජු කවුරුන් ද?

..................................................................................................................................

40. ජාත්‍යන්තර අධිකරණයේ විනිශ්චයකාරවරයකු මෙන් ම, එහි උප සභාපතිවරයකු වශයෙන් ද කටයුතු කළ ශ්‍රී ලාංකික කෘතහස්ත නීතිවේදියා කවුරුන් ද?

..................................................................................................................................

41. මෙරට උපරිමාධිකරණ හැරුණු විට සෙසු අධිකරණවල අධිකරණ බලය පිළිබඳ විධිවිධාන සලස්වා ඇත්තේ කවර පනතකට අනුව ද?

..................................................................................................................................

42. මෙරට විධායක කාරක සභා ක්‍රමය ක්‍රියාත්මක කරනු ලැබුවේ කවර ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයක යෝජනා මත ද?

..................................................................................................................................

43. ශ්‍රී ලංකා මහ බැංකුවේ 'මුදල් මණ්ඩලයේ (Monetary Board)' වර්තමාන සභාපතිවරයා කවුරුන් ද?

..................................................................................................................................

44. 2018 අගෝස්තු මාසයේ දී ආණ්ඩු පක්ෂය විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ නමුත් ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් විසින් ම විරුද්ධ ව ඡන්දය පාවිච්චි කොට පරාජය කරනු ලැබූ ලේඛනය කුමක් ද?

..................................................................................................................................

[ 6 වැනි පිටුව බලන්න.

45. තේ සහ රබර් වැනි වගා සඳහා අත්‍යවශ්‍ය වීමේ හේතුව මත ආනයන තහනම මෑත දී ඉවත් කරනු ලැබූ වල් නාශකය කුමක් ද?

........................................................................................................................................

46. බ්‍රිතාන්‍යයන් යටතේ පාලනය වූ ඉන්දියාව සහ චීනය අතර තිබුණු දේශ සීමාව හැඳින්වූයේ කවර නමකින් ද?

........................................................................................................................................

47. මෑත දී ඉන්දියාවේ ශ්‍රී ලංකා මහකොමසාරිස්වරයා ලෙස පත් කර යවනු ලැබුවේ කවුරුන් ද?

........................................................................................................................................

48. 2018 අගෝස්තු මාසයේ දී නාසා ආයතනය මගින් සූර්ය රැස් වළල්ල නිරීක්ෂණය සඳහා අභ්‍යවකාශ ගත කරන ලද යානයේ නම කුමක් ද?

........................................................................................................................................

49. වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් විධිවිධාන සලසා ඇති 'පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්' තනතුර වර්තමානයේ හොබවන්නේ කවුරුන් විසින් ද?

........................................................................................................................................

50. සෑම වර්ෂයක ම ලෝක පරිසර දිනය යෙදී ඇත්තේ කවර දිනක ද?

........................................................................................................................................

***

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ 2019 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් ඇතුළත්කර ගැනීම සඳහා පවත්වනු ලබන තරග විභාගය - 2018 සැප්තැම්බර්

**(02) සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය** — පැ දෙකයි

## II කොටස - බුද්ධි පරීක්ෂණය

### විභාග අපේක්ෂකයින්ට උපදෙස්

ඉතා වැදගත් :

පිළිතුරු ලිවීම සඳහා පැන්සල භාවිත නොකරන්න.



* පිළිතුරු සැපයීමේ දී පහත සඳහන් ආකාරයට ඉලක්කම් ලියා නැති උත්තර පත්‍ර ඇගයීමට ලක් නොකෙරේ.

**1 2 3 4 5**

ඔබේ විභාග අංකය මෙහි ද තුන්වන හා පස්වන පිටුවල ඇති තිත් ඉරි මත ද ලියන්න.

....................................

නිවැරදි බවට නිරීක්ෂකගේ කෙටි අත්සන

....................................

වැදගත් :

* විෂය අංක (02) සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය ප්‍රශ්න පත්‍රය, I කොටස - සාමාන්‍ය දැනීම හා II කොටස - බුද්ධි පරීක්ෂණය වශයෙන් කොටස් දෙකකින් යුක්ත වේ.
* එම කොටස් දෙකටම නියමිත කාලය පැය දෙකකි.
* මෙම II කොටස - බුද්ධි පරීක්ෂණය ප්‍රශ්න පත්‍රය පිටු **12** කින් හා ප්‍රශ්න **50** කින් යුක්ත වේ.
* ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.
* ශාලාධිපතිවරයා නිවේදනය කළ පසු පිළිතුරු ලිවීම ආරම්භ කරන්න.
* I කොටසේ හා II කොටසේ පිළිතුරු පත්‍ර වෙන වෙන ම ශාලාධිපතිට භාර දෙන්න.
* ගණකයන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු නොලැබේ.
* දී ඇති උපදෙස් අනුව ම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු වන අතර උපදෙස්වලට පටහැනිව සපයන පිළිතුරු සඳහා ලකුණු දෙනු නොලැබේ.
* ඔබට සැපයීමට පිළිතුරු නැතත් මෙම පිළිතුරු පත ශාලාධිපතිට භාර දිය යුතුය.
* ඔබේ පිළිතුරු පැහැදිලි ලෙස නිල් හෝ කළු පෑනෙන් පමණක් ලියන්න. පැන්සල් පාවිච්චි නොකරන්න.
* මෙම ප්‍රශ්න පත්‍රය විභාග ශාලාවෙන් පිටතට ගෙන යාම හෝ එහි ඡායා පිටපත් ගැනීම හෝ වරදකි.
* අපැහැදිලි ඉලක්කම්, අපැහැදිලි අත් අකුරු සහිත, මකන දියර භාවිත කරන ලද සහ පැන්සලෙන් පිළිතුරු සපයන ලද පිළිතුරු පත්‍ර ඇගයීමට ලක් නොකෙරේ.

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි**

| පිටුව | ප්‍රශ්න අංකය | ලැබූ ලකුණු |
|---|---|---|
| 2 | 1 - 8 | |
| 3 | 9 - 12 | |
| 4 | 13 - 16 | |
| 5 | 17 - 21 | |
| 6 | 22 - 25 | |
| 7 | 26 - 29 | |
| 8 | 30 - 31 | |
| 9 | 32 - 36 | |
| 10 | 37 - 40 | |
| 11 | 41 - 45 | |
| 12 | 46 - 50 | |
| එකතුව | | |

**අවසාන ලකුණු**

| | |
|---|---|
| ඉලක්කමෙන් | |
| අකුරින් | |

| | |
|---|---|
| උත්තර පත්‍ර පරීක්ෂක 1 | |
| උත්තර පත්‍ර පරීක්ෂක 2 | |
| ඇගයීම් ලකුණු පරීක්ෂක | |
| ප්‍රධාන පරීක්ෂක | |

[ 2 වැනි පිටුව බලන්න.

● අංක **1** සිට **5** තෙක් එක් එක් ප්‍රශ්නය යටතේ එකිනෙකට කිසියම් සබඳතාවක් දක්වන පද/අකුරු තුනක් මුලින් දී ඇත. එම පද/අකුරු තුන අතර පවත්නා සබඳතාව ම පවත්නා වෙනත් පද/අකුරු තුනක් එය ඉදිරියෙන් ලිවිය යුතුව ඇත. එම පද/අකුරු තුනෙන් දෙකක් දී ඇති අතර **?** සලකුණ සහිත ස්ථානයට තිබිය යුතු පදය/අකුර තෝරා, එහි අංකය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති තිත් ඉර මත ලියන්න.

1. බසය : කාරය : ත්‍රිරෝද රථය     මකුළුවා : .....?... : කපුටා
   (1) පත්තෑයා   (2) නයා   (3) ගවයා   (4) කුකුළා   (.........)

2. කොස් ගස : පොල් ගස : කෙසෙල් ගස     ....?... : කිතුල් ගස : අන්නාසි ගස
   (1) අඹ ගස   (2) දෙහි ගස   (3) උක් ගස   (4) කෝමාරිකා ගස   (.........)

3. තුන : හය : දහය     හය : දහතුන : ....?....
   (1) නවය   (2) පහළොව   (3) විසිඑක   (4) විසිපහ   (.........)

4. *A* : *D* : *G*     *O* : ....?... : *U*
   (1) *H*   (2) *P*   (3) *T*   (4) *R*   (.........)

5. ගඟ : සාගරය : මුහුද     ගම : ....?.... : දිස්ත්‍රික්කය
   (1) ඡන්ද කොට්ඨාසය   (2) කලාපය   (3) පළාත   (4) කොට්ඨාසය   (.........)

● අංක **6** සිට **10** තෙක් ප්‍රශ්න තර්කානුකූල නිගමනයකට එළඹීම පිළිබඳවයි.
මෙහි දී එක් එක් ප්‍රශ්නයේ මුලින් ප්‍රකාශ දෙකක් දී ඇත. ඒවා අනුව එළඹිය හැකි යැයි දැක්වෙන නිගමන දෙකක් දී ඇත. ඒවා බැලූ බැල්මට පිළිගත නොහැකි වුවත් තර්කානුකූලව එළඹිය හැකි නිගමන නම්, ඒ අනුව පහත දැක්වෙන තීරණවලින් එකකට එළඹ එම පිළිතුර ඇතුළත් වරණයෙහි අංකය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති තිත් ඉර මත ලියන්න.

***A*** - 1 නිගමනය පමණක් සත්‍යයි.
***B*** - 2 නිගමනය පමණක් සත්‍යයි.
***C*** - 1 හෝ 2 හෝ නිගමනය සත්‍යයි.
***D*** - 1 හා 2 යන නිගමන දෙකම අසත්‍යයි.
***E*** - 1 හා 2 යන නිගමන දෙකම සත්‍යයි.

6. ප්‍රකාශය I : අශ්වයන් සියල්ලම බල්ලන් ය.
   II : බල්ලන් සියල්ල මීයන් ය.
   නිගමනය 1 : අශ්වයන් සියල්ල මීයන් විය යුතු ය.
   2 : මීයන් සියල්ල බල්ලන් විය යුතු ය.
   තීරණ අතුරින් සත්‍ය වන්නේ,
   (1) ***A*** ය.   (2) ***B*** ය.   (3) ***C*** ය.   (4) ***D*** ය.   (.........)

7. ප්‍රකාශය I : කිසිදු කාසියක් රුපියලක් නොවේ.
   II : රිදී පෙත්ත කාසියකි.
   නිගමනය 1 : රිදී පෙත්ත රුපියලක් නොවේ.
   2 : රිදී පෙත්ත රුපියලක් වීමට ඉඩ ඇත.
   තීරණ අතුරින් සත්‍ය වන්නේ,
   (1) ***A*** ය.   (2) ***B*** ය.   (3) ***C*** ය.   (4) ***E*** ය.   (.........)

8. ප්‍රකාශය I : පියවරු සියල්ල පුතුන් ය.
   II : පුත්තු කිසිවෙක් උගතුන් නොවෙති.
   නිගමනය 1 : සමහර පියවරු උගතුන් වෙති.
   2 : පියවරු නොවන පුත්තු උගතුන් වෙති.
   තීරණ අතුරින් සත්‍ය වන්නේ,
   (1) ***B*** ය.   (2) ***C*** ය.   (3) ***D*** ය.   (4) ***E*** ය.   (.........)

[ 3 වැනි පිටුව බලන්න.

9. ප්‍රකාශය I : කෝප්ප සියල්ල පීරිසි ය.
II : පීරිසි කිසිවක් කේතලයක් නොවේ.
නිගමනය 1 : කෝප්ප කිසිවක් කේතලයක් නොවේ.
2 : කේතල කිසිවක් කෝප්පයක් නොවේ.
තීරණ අතුරින් සත්‍ය වන්නේ,
(1) ***A*** ය. (2) ***B*** ය. (3) ***C*** ය. (4) ***E*** ය. (.........)

10. ප්‍රකාශය I : පොත් සියල්ල සඟරා ය.
II : සඟරා සමහරක් නවකතා ය.
නිගමනය 1 : ඇතැම් පොත් නවකතා ය.
2 : පොත් කිසිවක් නවකතා නොවේ.
තීරණ අතුරින් සත්‍ය වන්නේ,
(1) ***A*** ය. (2) ***B*** ය. (3) ***C*** ය. (4) ***D*** ය. (.........)

● අංක **11** සිට **15** තෙක් ප්‍රශ්න පහත සඳහන් තොරතුරු මත පදනම් වේ.

* නීති විද්‍යාලයීය විවාද කණ්ඩායම සඳහා සිසුන් දෙදෙනෙකු ද සිසුවියන් දෙදෙනෙකු ද තෝරා ගත යුතුව ඇත.
* ඒ සඳහා පැවැති මූලික වටයේ දී තේරී ඇත්තේ සිසුවියන් තිදෙනෙකි.
* ඔවුහු අමලා, විමලා හා නිමලා ය.
* සිසුන් තේරී ඇත්තේ හතරක් පමණි.
* ඔවුහු නම් විමල්, නිමල්, බිමල් හා රනිල් ය.
* විමලා, විමල් සමග එකට කටයුතු කිරීමට අකමැති ය.
* නිමලා, බිමල් සමග එකට කටයුතු කිරීමට අකමැති ය.
* බිමල්, නිමල් සමග එකට කටයුතු කිරීමට අකමැති ය.

මේ අනුව නිවැරදි පිළිතුර තෝරා, එහි අංකය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති තිත් ඉර මත ලියන්න.

11. මුල් වටයේ දී විමල් ඉවත් වූයේ නම්, එම කණ්ඩායමේ සංයුතිය මින් කවරක් විය හැකි ද?
(1) රනිල්, නිමල්, අමලා හා නිමලා (2) නිමල්, බිමල්, අමලා හා නිමලා
(3) නිමල්, බිමල්, අමලා හා විමලා (4) රනිල්, බිමල්, අමලා හා නිමලා (.........)

12. විමල් තෝරා ගත් කණ්ඩායමේ සිටී නම්, කණ්ඩායමේ සිටිය හැකි අන් අය කවුරුන් ද?
(1) නිමල්, විමලා හා නිමලා (2) බිමල්, අමලා හා නිමලා
(3) රනිල්, අමලා හා නිමලා (4) රනිල්, විමලා හා නිමලා (.........)


කටුවැඩ සඳහා

13. විමලා හා නිමලා යන දෙදෙනාම තේරුනේ නම්, අනෙක් කවරකු නිශ්චිතව ම තේරේ ද?
   (1) විමල් හා නිමල්   (2) නිමල් හා රනිල්
   (3) බිමල් පමණි   (4) රනිල් පමණි   (.........)

14. මින් කවරක් අසත්‍ය වන්නේ ද?
   I. නිමල් හා නිමලා තේරෙනු නොහැකි ය.
   II. බිමල් හා විමලා තේරෙනු නොහැකි ය.
   III. රනිල් හා නිමලා තේරෙනු නොහැකි ය.
   (1) I පමණි.   (2) II පමණි.
   (3) III පමණි.   (4) I, II හා III යන සියල්ලම ය.   (.........)

15. අමලා පිළිබඳව මින් කවරක් සත්‍ය ද?
   I. අමලා අනිවාර්යයෙන් ම තේරිය යුතු ය.
   II. බිමල් තේරුනේ නම් අමලා ද තේරෙනු ඇත.
   III. විමල් හා බිමල් යන දෙදෙනාම තේරුනේ නම් අමලා තේරිය නොහැකි ය.
   (1) I පමණි.   (2) II පමණි.   (3) III පමණි.   (4) I හා III පමණි.   (.........)

● අංක **16** සිට **20** තෙක් ප්‍රශ්න නීතිඥ කාර්යාල සඳහා අලුතින් ඉදිකරන ලද කාමර හයකින් යුත් ගොඩනැගිල්ලක කාමර වෙන් කර දීම පිළිබඳවයි.




✤ මෙම කාමර *A, B, C, D, E, F* යන නීතිඥ මහතුන් වෙත පිරිනමා ඇත. ගොඩනැගිල්ලේ මැදින් කොරිඩෝරයක් ද ඒ දෙපස කාමර තුන බැගින් ද වෙයි.
   * කොරිඩෝරයේ දකුණු පස කාමර දෙකක් *B* හා *C* ට පවරා ඇත.
   * *A* ට පවරා ඇත්තේ වම්පස කාමරයකි.
   * *E* ට හා *F* ට ලැබුණේ කොරිඩෝරය දෙපස මුහුණට මුහුණ ලූ කාමර දෙකකි.
   * *C* ට හා *D* ට ලැබුණේ කොරිඩෝරය දෙපස මුහුණට මුහුණ ලූ කාමර දෙකකි.
   * *E* කැමැත්තෙන් සිටි නමුත් ගොඩනැගිල්ලේ කොනක කාමරයක් නොලැබිණි.
   * *F* ට ලැබුණේ *A* ගේ කාමරයට එපිටින් එම පැත්තේ ම කාමරයකි.

මෙම තොරතුරුවලට අනුව පහත එක් එක් ප්‍රශ්නයට නිවැරදි පිළිතුර තෝරා, ඊට අදාළ වරණයෙහි **අංකය** ප්‍රශ්නය ඉදිරියේ දී ඇති තිත් ඉර මත ලියන්න.

16. *E* සිය කාමරයේ සිට කොරිඩෝරය බලා හිඳ ගත් විට ඔහුගේ වම්පස කාමරය වෙන් වී ඇත්තේ මින් කාට ද?
   (1) *A*   (2) *B*   (3) *C*   (4) *D*   (.........)

කටුවැඩ සඳහා

17. *A* ගේ කාමරයට මුහුණ ලා ඇත්තේ කාගේ කාමරය ද?

(1) *B* (2) *C* (3) *D* (4) *E* (.........)

18. *F* ගේ අසල කාමර ලැබී ඇත්තේ කාට ද?

(1) *A* ට පමණි (2) *C* ට පමණි (3) *A* ට හා *D* ට (4) *B* ට හා *C* ට (.........)

19. සිය නීතිඥයාගේ කාමරය සෙවූ සේවාදායකයකුට යමකු මඟ පෙන්වූයේ මෙසේ ය.
"මේ කොරිඩෝරයේ දකුණු පැත්තේ කෙළවරේ කාමරය තමයි ඔහුගේ කාමරය"
ඒ කාගේ කාමරය ද?

(1) *A* (2) *B* (3) *C* (4) *F* (.........)

20. මුලු හතරේ කාමර කා හට ලැබුණු කාමර ද?

(1) *D, E, F, A* (2) *C, D, E, F* (3) *B, C, D, E* (4) *A, B, C, D* (.........)

● අංක **21** සිට **25** තෙක් ප්‍රශ්න 'ශක්ති' ශාරීරික යෝග්‍යතා සමාජය දෛනික ගාස්තු මත දෙනු ලබන 50% ක ප්‍රසාද වට්ටමට හිමිකම් කීම පිළිබඳ නීති පද්ධතියක් මත පදනම් වේ.

* 'ශක්ති' ශාරීරික යෝග්‍යතා සමාජයේ සේවය ලබා ගැනීමට පහත සඳහන් පුද්ගලයින්ට සිය දෛනික ගාස්තුවට 50% ක වට්ටමක් හිමි වෙයි.

(i) ආරම්භක සාමාජිකයන්ට ද ඔවුන්ගේ කලත්‍රයන්ට ද ඔවුන්ගේ වයස අවුරුදු 25 ට අඩු දරුවන්ට
(ii) ආබාධිත සාමාජිකයන්ට
(iii) වයස අවුරුදු 60 ට වැඩි ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට
(iv) ආරක්ෂක අංශවල නියුතු හා ඉන් විශ්‍රාම ලත් අයට, ඔවුන්ගේ කලත්‍රයන්ට හා ඔවුන්ගේ වයස අවුරුදු 18 ට අඩු දරුවන්ට
(v) රැකියාවක් නොකරන වයස අවුරුදු 35 ට අඩු කාන්තාවන්ට
(vi) ලියාපදිංචි සමාජ සේවා ආයතනවල සමාජ සේවකයන්ට
(vii) අවුරුදු 10 ක සාමාජික මුදල් එකවර ගෙවා බැඳුණු සාමාජිකයන්ට

මෙම තොරතුරුවලට අනුව පහත එක් එක් ප්‍රශ්නයේ සඳහන් පුද්ගලයා වට්ටම ලැබීමට සුදුසුකම් ලබා ඇත් ද එසේ නැති නම් සුදුසු නොවන්නේ ද යන බව තීරණය කර, පිළිතුරට අදාළ වරණය තෝරා, එහි **අංකය** ප්‍රශ්නය ඉදිරියේ දී ඇති තිත් ඉර මත ලියන්න.

21. * තිස්පස් වියැති ශ්‍රීමතී බාලපටබැඳි ආබාධිත සෙබළියකි.
* ඇගේ සැමියා 'ශක්ති' ශාරීරික යෝග්‍යතා සමාජයේ ආරම්භක සාමාජිකයෙකි.

ඒ අනුව ශ්‍රීමතී බාලපටබැඳි

(1) (i) හා (iv) යටතේ සුදුසුකම් ලබයි.
(2) (i) හා (ii) යටතේ සුදුසුකම් ලබයි.
(3) (i), (ii) හා (iv) යටතේ සුදුසුකම් ලබයි.
(4) සුදුසුකම් නොලබයි. (.........)

කටුවැඩ සඳහා

[ 6 වැනි පිටුව බලන්න.

22. ✳ දේවක රාමනායකගේ වයස අවුරුදු 14 කි.
✳ ඔහු විශ්‍රාමික සොල්දාදුවකු වන කෝප්‍රල් රාමනායකගේ පුත්‍රයායි.
✳ කෝප්‍රල් රාමනායක ප්‍රදේශයේ ජ්‍යෙෂ්ඨ පුරවැසි සංගමයේ සභාපති ය.
✳ කෝප්‍රල් රාමනායක ශක්ති ශාරීරික යෝග්‍යතා සමාජයේ දස වසරක සාමාජික මුදල් තෙවසරකින් ගෙවී යන පරිදි වාරික තුනකින් ගෙවීමට කටයුතු කර ඇත.

ඒ අනුව දේවක රාමනායක,

(1) (iv) යටතේ පමණක් සුදුසුකම් ලබයි. (2) (vi) හා (vii) යටතේ සුදුසුකම් ලබයි.
(3) (iv) හා (vii) යටතේ සුදුසුකම් ලබයි. (4) සුදුසුකම් නොලබයි. (.........)

23. ✳ කාදර් බුහාරි 28 වියැති ය.
✳ ඔහු ශක්ති ශාරීරික යෝග්‍යතා සමාජයේ ආරම්භක සාමාජික මොහමඩ් කාදර්ගේ පුත්‍රයෙකි.
✳ ප්‍රකට සමාජ සේවකයකු වන මොහමඩ් කාදර් ලියාපදිංචි ලේ බැංකුවක නිර්මාතෘ වෙයි.

මේ අනුව කාදර් බුහාරි,

(1) (i) යටතේ පමණක් සුදුසුකම් ලබයි. (2) (vi) යටතේ පමණක් සුදුසුකම් ලබයි.
(3) (i) හා (vi) යටතේ පමණක් සුදුසුකම් ලබයි. (4) සුදුසුකම් නොලබයි. (.........)

24. ✳ අනුජා ගමගේ, ශක්ති ශාරීරික යෝග්‍යතා සමාජයේ ආරම්භක සාමාජිකයකුගේ 18 වියැති දියණියකි.
✳ දක්ෂ පිහිනුම්කාරියක් හා ප්‍රවීණ චෙස් ක්‍රීඩිකාවක් ද වන ඇය පාසලේ ප්‍රධාන ශිෂ්‍ය නායිකාව ද වෙයි.
✳ ඇගේ පියා විශ්‍රාමික රජයේ සේවකයෙකි.

මේ අනුව අනුජා ගමගේ,

(1) (i) යටතේ පමණක් සුදුසුකම් ලබයි. (2) (iv) යටතේ පමණක් සුදුසුකම් ලබයි.
(3) (i) හා (v) යටතේ සුදුසුකම් ලබයි. (4) සුදුසුකම් නොලබයි. (.........)


25. ✳ 24 වියැති සුමනා ආරියසිරි ප්‍රකට සමාජ සේවකයකුගේ ලේලිය වෙයි.
✳ බැංකු නිලධාරිනියක වන ඇය ශක්ති ශාරීරික යෝග්‍යතා සමාජයේ වර්ෂ 7 ක සාමාජික මුදල් එකවර ගෙවා ඇත.
✳ ඇගේ ස්වාමිපුරුෂයා ශ්‍රී ලංකා යුධ හමුදාවේ බ්‍රිගේඩියර්වරයෙකි.

මේ අනුව සුමනා ආරියසිරි,


(1) (i) යටතේ පමණක් සුදුසුකම් ලබයි. (2) (iv) යටතේ පමණක් සුදුසුකම් ලබයි.
(3) (vi) හා (vii) යටතේ සුදුසුකම් ලබයි. (4) සුදුසුකම් නොලබයි. (.........)

කටුවැඩ සඳහා


- අංක **26** සිට **30** තෙක් ප්‍රශ්න සඳහා එක් එක් ප්‍රශ්නයේ මුලින් රූපය බැගින් දී ඇත. එය විනිවිද පෙනෙන සවි කඩදාසියක (ට්‍රේසිං කොළයක) ඇඳ ඇති නම්, එය කණපිට පෙරළූ විට පෙනෙන ආකාරය පහතින් දී ඇති කවරක් විය හැකි දැයි, දී ඇති වරණ අතුරින් තෝරා, එහි අංකය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති තිත් ඉර මත ලියන්න.

26. 


කණපිට කවරක් ද?




(1) (2) (3) (4) (.........)

27. 

කණපිට කවරක් ද?




(1) (2) (3) (4) (.........)


28. 




කණපිට කවරක් ද?




(1) (2) (3) (4) (.........)

29. 


කණපිට කවරක් ද?





(1) (2) (3) (4) (.........)


30. 

කණපිට කවරක් ද?


(1)


(2)


(3)


(4)

(………)

● අංක **31** සිට **35** තෙක් ප්‍රශ්නවලින් දැක්වෙන්නේ ග්‍රාමීය බැංකුවකින් ණයක් ගැනීමේ දී ගොවියකුට පිළිපැදීමට සිදුවන කොන්දේසි වේ.

✳ ගොවියා පිළිපැදිය යුතු කොන්දේසි මෙසේ ය.

(i) වගා කළ හැකි අක්කර 8ක වත් ඉඩමක් සතු විය යුතු ය.

(ii) රුපියල් ලක්ෂ 8ක් වත් වටිනා උගසක් හෝ ඇපයක් සැපයිය යුතු ය.

(iii) 2019 ජනවාරි 01 වැනි දිනට වයස අවුරුදු 50 නොඉක්ම විය යුතු ය.

(iv) බැංකුවකින් ලබාගත් නොපියවූ ණයක් නොතිබිය යුතු ය.

(v) ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය ලබා ගත යුතු ය.

තව ද,

(අ) මෙහි දැක්වෙන (i) හැර සෙසු කොන්දේසි සපුරාලිය හැකි ගොවියකු එකී අවශ්‍යතාව වගා කළ හැකි ඉඩම් කැබලි දෙකකින් සපුරාලන්නේ නම්, එම ඉල්ලීම බැංකුවේ සභාපති වෙත යොමු කළ යුතු ය.

(ආ) මෙහි දැක්වෙන (ii) කොන්දේසිය සපුරාලිය නොහැකි ගොවියකු බැංකුවේ ලක්ෂ 4 ක ස්ථිර තැන්පතුවක් සතු නම්, එම ඉල්ලුම්පත බැංකුවේ සාමාන්‍යාධිකාරි වෙත යොමු කළ යුතු ය.

මේ අනුව පහත දැක්වෙන එක් එක් ප්‍රශ්නයේ ඉල්ලුම්කාර ගොවියකුගේ තොරතුරු දක්වා ඇත. එම තොරතුරු මත පදනම් වී එක් එක් ගොවියා පිළිබඳව ගන්නා තීරණය,

✳ ණය පහසුකම ප්‍රදානය කළ නොහැකි නම් ***A*** ලෙස ද

✳ ණය ඉල්ලුම්පත බැංකුවේ සාමාන්‍යාධිකාරි වෙත යොමු කරන්නේ නම් ***B*** ලෙස ද

✳ සපයා ඇති තොරතුරු තීරණ ගැනීමට ප්‍රමාණවත් නොවේ නම් ***C*** ලෙස ද

✳ ණය පහසුකම සැලසිය හැකි නම් ***D*** ලෙස ද

✳ ණය ඉල්ලුම්පත බැංකුවේ සභාපති වෙත යොමු කරන්නේ නම් ***E*** ලෙස ද

ගෙන අදාළ **ඉංග්‍රීසි අක්ෂරය** ප්‍රශ්න ඉදිරියේ දී ඇති තිත් ඉර මත ලියන්න.

31. කෝනගහ මර්තේලිස් සතු අක්කර පහක පොල් වගාවක් වෙයි. ඔහුට රුපියල් ලක්ෂ 8 ක් වටිනා අක්කර හතරක වීකල්ප ඉඩමක් ද සතු වෙයි. ඔහුගේ උපන් දිනය 1975.05.10 වන අතර ඔහු කිසිදු බැංකුවකින් ණයක් ලබාගෙන නැත. ඔහු ප්‍රාදේශීය ලේකම්වරයාගේ නිර්දේශ ලබාගෙන ඇත. (………)

කටුවැඩ සඳහා


32. සුරබියල් කෝවිස් 1971 නොවැම්බර් මස 8 වැනිදා උපන්නෙකි. වගා කළ හැකි අක්කර 4 ක මඩ ඉඩමක් ඔහු සතු ය. එහි කන්න දෙකක් ම වගා කළ හැකි ය. ඇපයට තැබිය හැකි රුපියල් ලක්ෂ 9 ක දේපලක් ද ඔහු සතු ය. ඔහු බැංකුවෙන් ණය ලබාගෙන නැත. (.........)


33. විල්සන් දේවදාසන් 1975 පෙබරවාරි 10 වැනි දින උපත ලබා ඇත. ඔහු සතු එකම ඉඩම වන අක්කර 6 ක මුළු ඉඩමේ ම පොල් වගා කර ඇත. ඔහු ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශයක් ද ලබාගෙන ඇත. ලක්ෂ 8 කට වඩා ඇපයක් තැබීමට ඔහුට හැකි ය. බැංකුවෙන් ලබාගෙන ඇති ණයෙන් දැන් ඔහු නිදහස් ය. (.........)


34. 1970 ජුනි මස 8 වැනිදා උපන් රිස්වි කාසිම් සතුව අක්කර 8 ක කුඹුරු යායක් ඇත. ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශයක් ද ලබාගෙන ඇත. ඔහුට ලක්ෂ 8 ක ඇපයක් දිය හැකි ය. බැංකුවේ ලක්ෂ 6 ක ස්ථිර තැන්පතුවක් ඇති ඔහු කිසිම බැංකුවකින් ණයක් ලබා ගෙන නොමැත. (.........)

35. හතළිස් අට හැවිරිදි විග්නේෂ්වරන් තෝමස් අක්කර නවයක වී ගොවිතැන් කරන්නෙකි. ඔහු දෙකන්නය ම වගා කරයි. ප්‍රාදේශීය ලේකම්ගෙන් නිර්දේශ ලබාගෙන ද ඇත. උගසක් හෝ ඇපයක් සපයා නැත. නමුත් ඔහු සතුව ලක්ෂ 6 ක ස්ථිර තැම්පතුවක් ඇති අතර කිසි දිනෙක බැංකුවකින් ණයක් ලබාගෙන නැත. (.........)


- අංක **36** සිට **40** තෙක් ප්‍රශ්නවල මුලින් රූපයක් දී ඇත. ඊට වඩාත් ම සමානකම් දක්වන රූපය පහත රූප පහ අතුරින් තෝරා, ඊට අදාළ අංකය ප්‍රශ්නය ඉදිරියේ දී ඇති තිත් ඉර මත ලියන්න.


36. 

 (1)

 (2)

 (3)


 (4)


 (5)

(.........)


---


**කටුවැඩ සඳහා**

37. 





(1) (2) (3) (4) (5) (………)

38. 




(1) (2) (3) (4) (5) (………)

39. 



(1) (2) (3) (4) (5) (………)

40. 



(1) (2) (3) (4) (5) (………)

● අංක **41** සිට **45** තෙක් එක් එක් ප්‍රශ්නයේ සංඛ්‍යා ජාලයක් පෙන්වා ඇත. ඒවායේ එක් එක් පේළියේ සංඛ්‍යා දක්වා ඇත්තේ කිසියම් රටාවකට ය. එය හඳුනාගෙන **?** ලකුණින් දැක්වෙන කොටුවේ තිබිය යුතු සංඛ්‍යාව සොයා, එම සංඛ්‍යාව ප්‍රශ්නය ඉදිරියේ දී ඇති තිත් ඉර මත ඉලක්කමෙන් පමණක් ලියන්න.

41.

| | | | |
|---|---|---|---|
| 6 | 14 | 5 | 4 |
| 8 | 4 | 2 | 6 |
| 9 | 16 | 5 | 5 |
| 7 | 7 | ? | 7 |

(.........)

42.

| | | | |
|---|---|---|---|
| 10 | 2 | 4 | 2 |
| 20 | 4 | 8 | 2 |
| 30 | 15 | 3 | 5 |
| 40 | 8 | ? | 2 |

(.........)

43.

| | | | |
|---|---|---|---|
| 8 | 4 | 2 | 4 |
| 5 | 10 | 4 | 2 |
| 7 | 4 | 8 | 14 |
| 9 | 6 | ? | 3 |

(.........)

44.

| | | | |
|---|---|---|---|
| 5 | 4 | 7 | 6 |
| 8 | 9 | 9 | 10 |
| 7 | 10 | 1 | 4 |
| 12 | 10 | ? | 3 |

(.........)


45.

| | | | |
|---|---|---|---|
| 4 | 2 | 8 | 10 |
| 3 | 2 | 6 | 8 |
| 5 | 3 | 15 | ? |
| 6 | 3 | 18 | 21 |

(.........)

කටුවැඩ සඳහා

- අංක **46** සිට **50** තෙක් ප්‍රශ්න රූපයේ දැක්වෙන බිත්ති මුල්ලක තබා ඇති ඝනකාකාර කැට සමූහය මත පදනම් වේ. එය අධ්‍යයනය කොට පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සොයා, එම **පිළිතුර** ප්‍රශ්නය ඉදිරියේ දී ඇති **තිත් ඉර මත ඉලක්කමෙන් පමණක්** ලියන්න.



46. මෙම කැට සමූහයේ කැට කීයක් තිබේ ද? (.........)

47. රූපයේ දක්වා ඇති පරිදි මෙහි පෙනෙන මුහුණත් ගණන කීය ද? (.........)

48. රූපයේ දක්නා පරිදි මෙහි නොපෙනෙන මුහුණත් ගණන කීය ද? (.........)

49. මෙහි බිම පතිත මුහුණත් කීයක් තිබේ ද? (.........)

50. මෙහි එකිනෙක ඇළුණු මුහුණත් යුගල කීයක් තිබේ ද? (.........)

කටුවැඩ සඳහා

* * *